## 5. අන්‍යෝන්‍යාධාර යෝජනා ක්‍රමය

1981 වර්ෂයේදී අන්‍යෝන්‍යාධාර අරමුදල ආරම්භ කල අතර, එහිදී සෞඛ්‍ය සේවයෙන් විශ්‍රාම යාම හෝ සේවය අවසන් කරන අවස්ථාවේදී සමිතියේ සාමාජිකත්වයෙන්ද ඉවත්ව යන සාමාජිකත්වයට අන්‍යෝන්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ ඔවුන්ගේ ගිණුමේ පවතින දායක මුදල් වලට අතිරේක වශයෙන් අන්‍යෝන්‍යාධාර ප්‍රදානයන් සමිතිය මඟින් පිරිනමනු ලබයි. මෙම යෝජනා ක්‍රමය සඳහා අවම වශයෙන් වසර 05 ක් දායක වී තිබිය යුතුය.

අන්‍යෝන්‍යාධාර අරමුදල සඳහා දායක වීමේ සාමාජික කාලය හා දායකත්වයට අනුව මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රධානයන් ලබා ගැනීමේ හැකියාව පවතී. මෙම ක්‍රමය යටතේ කුඩා ඉතුරුම් මුදලක දායකත්වය ලබා ගනිමින් විශ්‍රාම යන අවස්ථාවේදී ප්‍රදානයක් සහිතව පිරිනමනු ලබයි.